වාවකච්චේරි ප්‍රාදේශීය සභාව - 2023
-----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වාවකච්චේරි ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට **වාවකච්චේරි** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | දේශීය ණය සංවර්ධන ප්‍රදාන යටතේ මූලධන කාර්යයන් 07ක් සඳහා ලබාගෙන තිබූ එකතුව රු.24,511,162 ක් විවිධ තැන්පතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කර ක්‍රියාත්මක කිරිමට නියමිත බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |
| (ආ) | වැඩ නිමකළ සංවර්ධන කාර්යයන් 08ක පිරිවැය එකතුව රු. 12,729,203ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම්තල ගැලපීමට කටයුතු කරන බව. | ගිණුම් නිවැරදිව සකස් කළ යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| ගබඩා ලෙජරය අනුව 2023 දෙසැම්බර් 31 දිනට ගබඩා භාණ්ඩ ශේෂය හා මූල්‍ය ප්‍රකාශන අනුව එදිනට එම ශේෂය අතර රු.504,572ක වෙනසක් පැවතුණි. | වෙනසට හේතු විමසීම් කර ජ'නල් සටහන් මගින් ගැලපීම් කිරීමට කටයුතු කරමින් පවතින බව. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ අදාළ ප්‍රභව ලියවිලි සමඟ සැසඳිය හැකි විය යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු රු.3,035,653කට අදාල ලේඛන, ශේෂ ලැයිස්තු හා කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොකිරිමෙන් සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | ඉදිරි කාලයේ මෙම කරුණට අවධානය යොමුකරන බව. | ලේඛන, ශේෂ ලැයිස්තු හා කාල විශ්ලේෂණ පිළියෙල කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

#### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් වරිපනම් හා බදු අයවිය යුතු දේපළ 7,122කින් දේපළ 1,507ක් සඳහා K ආකෘති පත්‍ර බෙදා හැර නොතිබුණි. | ඉදිරියේදී දේපල ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු මුළුමනින්ම K ආකෘති බෙදාහැරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පාලන රීතිවල III පරිච්ඡේදයේ 32 (III) වගන්තිය | සභාවේ උප කාර්යාල 03ක වරිපනම් බදු අයකිරීම් සම්බන්ධ ලේඛන පවත්වා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දී වරිපනම් බදු අයකිරීමද සිදුකර නොතිබුණි. | තක්සේරු කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින බව. | වරිපනම් බදු අයකිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 121,510,834 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 93,742,027 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 162,000 | 207,756 | 124,522 | 3,035,653 | 163,465 | 165,899 | 14,637 | 2,952,419 |
| කුලී | 21,755,150 | 25,331,942 | 25,339,642 | 38,050 | 15,313,200 | 17,036,028 | 16,990,278 | 45,750 |
| බලපත්‍ර ගාස්තු | 2,634,000 | 2,744,245 | 2,744,245 | - | 2,555,250 | 1,635,918 | 1,635,918 | - |
| වෙනත් ආදායම් | 68,117,200 | 123,703,079 | 123,703,079 | - | 43,565,435 | 93,208,188 | 93,208,188 | - |
| එකතුව | **92,668,350** | **151,987,022** | **151,911,488** | **3,073,703** | **61,597,350** | **112,046,033** | **111,849,021** | **2,998,169** |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 01 ත් වර්ෂ 05ත් අතර කාලපරිච්ඡේදයට අදාල හිඟහිටි වරිපනම් බදු රු. 3,035,653ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා පියවර ගෙන නොතිබුණි. | ජංගම සේවාවන් මාර්ගයෙනුත් රැස්කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟහිටි අයකිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ සංවර්ධන සංචිත අරමුදල් මඟින් පසුගිය වර්ෂ 01ත් වර්ෂ 07ත් අතර කාලය තුළ ක්‍රියාත්මක කළ රු. 102,312,634ක් වූ සංවර්ධන ව්‍යාපෘති 43ක් අතරමග අත්හැර දමා තිබුණි. | වර්තමානයේ ලංසු කැඳවා ඇස්තමේන්තු සකස් කර ඇති හෙයින් මෙම වර්ෂය අවසාන වන විට සියළු කාර්යයන් අවසන් කරන බව. | අදාළ සංවර්ධන කාර්යයන් නියමිත කාල පරාසය තුළ ඉටු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභාව සතු කඩකාමර 08ක් කුලියට ලබා දී නොතිබීමෙන් රු.650,500 ක ආදායම් අහිමි වී තිබුණි. | කඩකාමර කුලියට දීම සම්බන්ධයෙන් අවස්ථා කිහිපයක ලංසු කැඳවූ නමුත් කිසිවෙකුත් ඉදිරිපත් නොවූ බව. | සභාවේ ආදායම් මූලාශ්‍ර සම්පූර්ණ ලෙස භාවිතා කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | වර්ෂ 03 සිට 05කට වරක් අළුත් කළයුතු කඩකාමර 15ක දීර්ඝකාලීන කුලී ගිවිසුම් එලෙස අළුත් නොකර අඛණ්ඩව පසුගිය වර්ෂ 01 සිට 06ක් දක්වා කාලයක් පවත්වාගෙන ගොස් තිබුණි. | ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව ගිවිසුම් අළුත්කිරීමට කටයුතු කරන බව. | කුලී ගිවිසුම් නියමිත කාලවකවානු තුළ අළුත්කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොදු ළිං 187ක්, සුසාන භූමි 45ක් සහ ඉඩම් හා ගොඩනැගිලි 21ක් මේ දක්වා සභාව වෙත පවරා ගෙන නොතිබුණි. එමෙන්ම, සමාලෝචිත වර්ෂය තුළ රු. 5,482,112ක් වූ ගොඩනැගිලි 08ක් 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ 1.1 ඡේදයට පටහැනිව සභාව සතු නොවූ ඉඩම්වල ඉදි කර තිබුණි. | පවරා ගැනීමට සහ තක්සේරු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා ගෙන් පිඹුරුපත් ඉල්ලා ලිපි යවා ඇති බව. | වත්කම්වල හිමිකාරත්වය නිරවුල් කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | එකතුව රු.11,258,238ක ගොඩනැගිලි 13ක් 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ 1.1 ඡේදයට පටහැනිව සභාව සතු නොවූ ඉඩම්වල ඉදිකර තිබුණි. | පවරා ගැනීමට සහ තක්සේරු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා ගෙන් පිඹුරුපත් ඉල්ලා ලිපි යවා ඇති බව. | වත්කම්වල හිමිකාරත්වය නිරවුල් කරගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පුස්තකාල භාවිතය සඳහා මිලදී ගත් රු. 3,183,200ක පිරියත හා යන්ත්‍ර, රු.231,450ක් වූ ගෘහ භාණ්ඩ සහ පෙර පාසැල් සංවර්ධනය සඳහා මිලදී ගත් රු.1,289,500ක් වූ පිරියත යන්ත්‍රෝපකරණ මේ දක්වා අභාවිතව පැවැතුණි. | භාවිතා කිරීමට කටයුතු කරන බව. | වත්කම් මුළුමනින්ම උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ප්‍රකාරව ඇස්තමේන්තු ගත ආදායම් සහ වියදම් හා තථ්‍ය ආදායම් සහ වියදම් සමග සැසඳීමේදී ආදායම් විෂයන් 04ක සියයට 25 සිට සියයට 129ක් දක්වාත්, වැය විෂයන් 05ක සියයට 20ක සිට සියයට 60ක් දක්වාත් මූලධන වැය විෂයක සියයට 79ක විචලනයක්ද පැවැතීම හේතුවෙන් අයවැය, ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | ඉදිරියේදී ආදායම් හා වියදම් ඇස්තෙමින්තුවල නිවැරදි කර තාත්ත්වික අයවැයක් සැකසීමට කටයුතු කරන බව. | අවශ්‍යතා හඳුනාගෙන සැලැකිලිමත් ලෙස අයවැය සකස් කළ යුතුය. |